ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1771/19 - 2012 අගෝස්තු මස 15 වැනි බදාදා - 2012.08.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 14/2008.

**2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත**

2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 6 වැනි වගන්තියේ (උ) ඡේදය සහ 39 වැනි වගන්තිය සමග කියවිය යුතු 51 වැනි වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ පරිසර අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

පරිසර අමාත්‍ය.

2012 ජූලි මස 30 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2012 අංක 01 දරන තෙල් උතුරායාම පිළිබඳ හදිසි සැලැස්ම නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙම නියෝග, ශ්‍රී ලංකා ජල තීරය තුළ සහ 1976 අංක 22 දරන සමුද්‍රීය කලාප නීතිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද යම් සමුද්‍ර කලාපයක් තුළ ඇති වරාය, නැව්තොටවල්, පර්යන්ත, නැව් අලුත්වැඩියා පොළවල්, නිර්ජල නැව් තටාකාංගන, අක්වෙරළේ ඉදිකිරීම් හෝ නැවකින් නැවකට තෙල් මාරු කිරීම සඳහා භාවිතා කරන නල මාර්ග හෝ වෙනත් යම් උපකරණ භාරව සිටින සෑම අයිතිකරුවකු, ක්‍රියාකරුවකු, නෞකාධිපතිවරයකු හෝ ඔවුන්ගේ අනුයෝජිතයකු හෝ වෙනත් යම් තැනැත්තකු විසින් අදාළ කරගත යුතු ය.

3. මෙම නියෝග අදාළ වන –

(i) වරායක, නැව්තොටක, පර්යන්තයක, නැව් අලුත්වැඩියා පොළක හෝ නිර්ජල නැව් තටාකාංගනයක ; හෝ

(ii) නැවකට නැතහොත් නැවකින් තෙල් මාරු කිරීම සඳහා භාවිත කරන නල මාර්ගයක හෝ වෙනත් යම් උපකරණයක ;

(iii) තෙල් ලබාගැනීම සඳහා සහ තෙල් මාරු කිරීම සඳහා භාවිත කරන අක්වෙරළ ඉදිකිරීම්,

සෑම අයිතිකරුවකු, ක්‍රියාකරුවකු, නෞකාධිපතිවරයකු හෝ අනුයෝජිතයකුටම, (මෙහි මින් මතු “අධිකාරිය” යනුවෙන් සඳහන් කරනු ලබන) සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරය විසින් සකස් කර කලින් කලට ප්‍රතිශෝධනය කරන ලද සහ

අධිකාරිය විසින් අනුමත කරන ලද තෙල් උතුරා යාම පිළිබඳ ජාතික සැලැස්මට අනුකූල වූ තෙල් උතුරායාම පිළිබඳ හදිසි සැළසුමක් තමා සන්තකයේ තබා ගැනීමට නියම කරනු ලැබිය යුතු ය.

4. වරාය, නැව්තොටවල්, පර්යන්ත, නැව් අලුත්වැඩියා පොළවල්, නිර්ජල නැව් තටාකාංගන, අක් වෙරළේ ඉදිකිරීම් හෝ නැවකින් නැවකට තෙල් මාරු කිරීම සඳහා භාවිතා කරන නල මාර්ග හෝ වෙනත් යම් උපකරණ සඳහා එක් එක් සැලසුමක් තිබිය යුතු ය.

එසේ වුවද :–

(i) අධිකාරිය විසින්, නිශ්චය කරනු ලැබිය හැකි යම් ප්‍රදේශයක් තුළ වරායවල්, නැව්තොටවල්, පර්යන්ත, නැව් අලුත්වැඩියා පොළවල් හෝ නිර්ජල නැව් තටාකාංගන අතර ;

(ii) යම් ඉදිකිරීම් හෝ උපකරණ සම්බන්ධ වන නල මාර්ග ඇතුළත්වන අක්වෙරළ ඉදිකිරීම් සහ තෙල් මෙහෙයුම් උපකරණ සම්බන්ධයෙන්

ඒකාබද්ධ සැළසුම් සකස් කරනු ලැබිය හැකි ය.

5. වරාය, නැව්තොටවල්, පර්යන්ත, නැව් අලුත්වැඩියා පොළවල්, නිර්ජල නැව් තටාකාංගන, අක්වෙරළේ ඉදිකිරීම් හෝ නැවකින් නැවකට තෙල් මාරු කිරීම සඳහා භාවිතා කරන නල මාර්ග හෝ වෙනත් යම් උපකරණ සෑම අයිතිකරුවකු, ක්‍රියාකරවන්නකු හෝ අනුයෝජිතයකු විසින්ම තෙල් උතුරායාමේ හදිසි සැලැස්මක් 10 වන නියෝගයේ විධිවිධානවලට අනුකූලව එහි අනුමැතිය සඳහා අධිකාරිය වෙත් ඉදිරිපත් කළ යුතු ය.

6. මෙම නියෝග ක්‍රියාත්මකවීමෙන් පසුව කටයුතු කිරීම ආරම්භ කරන –

(i) වරයා, නැව්තොටවල්, පර්යන්ත, නැව් අලුත්වැඩියා පොළවල්, නිර්ජල නැව් තටාකාංගන ;

(ii) තෙල් තබා ගැනීම හෝ තෙල් මාරු කිරීම සඳහා භාවිත කරන නල මාර්ග හෝ වෙනත් යම් උපකරණ සහ අක්වෙරළ සවිකිරීම් ; හෝ

(iii) තෙල් පිළිබඳ කැනීම් කිරීම හෝ ගවේෂණ කිරීම සඳහා ඇතුළුව නැවකට හෝ නැවකින් තෙල් මාරු කිරීම සඳහා වූ වෙනත් උපකරණ භාරව සිටින යම් තැනැත්තතුට එම කටයුත්ත ආරම්භවන දිනයට පෙරාතුව මාස දෙකක් ඇතුළත අධිකාරියට තෙල් උතුරායාම පිළිබඳ හදිසි සැලසුමක් භාරදීමට නියම කරනු ලැබිය යුතු ය.

7. වරාය, නැව්තොවල්, පර්යන්ත, නැව් අලුත්වැඩියා පොළවල්, නිර්ජල නැව් තටාකාංගන, අක්වෙරළේ ඉදිකිරීම් හෝ නැවකින් නැවකට තෙල් මාරු කිරීම සඳහා භාවිතා කරන නල මාර්ග හෝ වෙනත් යම් උපකරණ සෑම අයිතිකරුවකු, ක්‍රියාකරුවකු, අනුයෝජිතයකු විසින් –

(i) අවුරුදු දෙකකට පසු නොවන කාලසීමාවක දී හෝ අධිකාරිය විසින් නියම කළ පරිදි සහ නියම කළ දිනක දී එහි අනුමත කරන ලද තෙල් උතුරායාම පිළිබඳ හදිසි සැළසුම් ප්‍රතිශෝධනය කළ යුතු ය ;

(ii) පවතින සැලසුමේ වලංගුභාවයට හෝ බලාත්මකභාවයට බලපාන හෝ බලපෑහැකිවන යම් ප්‍රධාන වෙනස්කමක් සිදු කරන ලද්දේ යම් දිනයක දී ද ඒ දිනයේ සිට මාස දෙකක් ඇතුළත අලුත් සැලසුමක් හෝ පවතින සැලසුමට සිදු කරන ලද සංශෝධන භාරදෙනු ලැබීය,

යුතු ය.

8. 5 වන, 6 වන හෝ 7 වන නියෝග යටතේ භාරදෙන ලද යම් සැලසුමක් හෝ සංශෝධනයක් –

(i) තත්කාලයේ බලපවත්නා වූ තෙල් උතුරායාම පිළිබඳ ජාතික වශයෙන් හදිසි සැලැස්මට අනුකූල නොවන බවට ;

(ii) වරාය, නැව්තොටවල්, පර්යන්ත, නැව් අලුත්වැඩියා පොළවල්, නිර්ජල නැව් තටාකාංගන, අක්වෙරළේ ඉදිකිරීම් හෝ නැවකින් නැවකට තෙල් මාරු කිරීම සඳහා භාවිතා කරන නල මාර්ග හෝ වෙනත් යම් උපකරණ අයිතිකරුවකු, ක්‍රියාකරුවකු, නෞකාධිපතිවරයකු හෝ අනුයෝජිතයකුගේ ප්‍රදේශයක් තුළ දී සිදුවිය හැකි තෙල් දූෂණ සිද්ධීන් පිළිබඳ කටයුතු කිරීම සඳහා බලතල හෝ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සඳහා උචිත නොවන බවට,

අධිකාරියේ මතය වන අවස්ථාවක දී, අධිකාරිය විසින්, වරාය, නැව්තොටවල්, පර්යන්ත, නැව් අලුත්වැඩියා පොළවල්, නිර්ජල නැව් තටාකාංගන, අක්වෙරළේ ඉදිකිරීම් හෝ නැවකින් නැවකට තෙල් මාරු කිරීම සඳහා භාවිතා කරන නල මාර්ග හෝ වෙනත් යම් උපකරණ අයිතිකරු, ක්‍රියාකරු හෝ අනුයෝජිතයා විමසා ඒ අනුකූලව ඒ සැලසුම සංශෝධනය කරනු ලැබීමට නියම කරනු ලැබිය හැකි ය. එවැනි යම් විධානයකට අනුකූලව සැලසුම සංශෝධනය කිරීම අයිතිකරුගේ, ක්‍රියාකරවන්නාගේ, නෞකාධිපතිවරයාගේ හෝ අනුයෝජිතයාගේ කාර්යය විය යුතු ය.

9. අධිකාරිය විසින් ලිඛිතව බලය දුන් යම් නිලධරයකු විසින් තෙල් උතුරා යාම පිළිබඳ හදිසි සැලසුම අනුමත කිරීමට පෙරාතුව සැලසුමේ සඳහන් කරන ලද ස්ථානය සහ උපකරණවල අනනුකූලතාව පිළිබඳ පරීක්ෂාකර බලා මෙහි I වැනි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති නිර්ණායක සමග තෙල් උතුරායාම පිළිබඳ ජාතික වශයෙන් හදිසි සැලසුම සමග සසඳා සැලසුමේ අනුකූලතාව පිළිබඳ සෑහීමකට පත් විය යුතු ය.

10. තෙල් උතුරායාම පිළිබඳ හදිසි සැලසුමක අනුමතය බලාපොරොත්තුවන සෑම ඉල්ලුම්කරුවකුම –

(අ) 6 වන සහ 8 වන නියෝගවලට යටත්ව 5 වන නියෝගයට අනුකූලව තෙල් උතුරායාම පිළිබඳ හදිසි සැලසුමේ අනු පිටපතක් සමග II වැනි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරන ලද ආකෘතියකින් ඉලුල්ම් පත්‍රයක් භාර දිය යුතු ය ;

(ආ) ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙන් –

(i) අධිකාරියේ තීරණයට එළඹීමට අධිකාරියට පහසු කරවමින් අධිකාරිය විසින් නියම කරන වෙනත් යම් තොරතුරු ; සහ

(ii) මෙහි III වැනි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති ඉල්ලුම් පත්‍ර ගාස්තුව ගෙවීම සම්බන්ධ කුවිතාන්සිය,

භාරදිය යුතු ය.

11. (අ) මෙම නියෝගවල 10 වැනි නියෝගයේ නියමයන්ට අනුව ඉල්ලුම් පත්‍රය ලැබූ දින සිට දින විස්සක් ඇතුළත, තෙල් උතුරා යාම පිළිබඳ හදිසි සැලසුම සම්බන්ධයෙන් අධිකාරිය විසින් ගනු ලැබූ තීරණය පිළිබඳ සෑම ඉල්ලුම්කරුවකුටම දැනුම් දෙනු ලැබිය යුතු ය.

(ආ) තෙල් උතුරායාම පිළිබඳ හදිසි සැලසුමක අනුමතය පිළිබඳ දැන්වීමක් ඉල්ලුම්කරුට ලැබී ඇති අවස්ථාවක දී ඉල්ලුම්කරු විසින්, තෙල් උතුරා යාම පිළිබඳ හදිසි සැලසුම සම්බන්ධයෙන් වූ ඒ අනුමතය පිළිබඳ දැන්වීම ලැබීමෙන් දින දාහතරක් ඇතුළත මෙහි III වැනි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති ගාස්තු ගෙවිය යුතු ය.

(ඇ) මෙහි III වැනි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති ගාස්තු ලැබුණු පසුව, අධිකාරිය විසින්, මෙහි IV වැනි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති ආකෘතියෙන් වූ විධිමත් අනුමතයක් ඉල්ලුම්කරු වෙත නිකුත් කළ යුතු ය.

12. 3 වැනි නියෝගයේ නිශ්චිතව සඳහන් කර ඇති උපකරණයක සෑම අයිතිකරුවකු, ක්‍රියාකරුවකු, නෞකාධිපතිවරයකු හෝ අනුයෝජිතයකු විසින්ම –

(i) (මෙහි මින් මතු "බලයලත් නිලධරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරිය විසින් බලය දී ඇති යම් නිලධරයකුට පරීක්ෂාකර බැලීම සඳහා ලබාගැනීමට ඒ තෙල් උතුරායාම පිළිබඳ හදිසි සැලසුමක් තැබිය යුතු ය ;

(ii) වරාය, නැව්තොටවල්, පර්යන්ත, නැව් අලුත්වැඩියා පොළවල්, නිර්ජල නැව් තටාකාංගන, අක්වෙරළේ ඉදිකිරීම් හෝ නැවකින් නැවකට තෙල් මාරු කිරීම සඳහා භාවිතා කරන නල මාර්ග හෝ වෙනත් යම් උපකරණ පරීක්ෂා කර බැලීම සඳහා බලයලත් නිලධරයකුට ප්‍රවේශය ලබාදිය යුතු ය ;

(iii) තෙල් උතුරායාම පිළිබඳ ජාතික වශයෙන් හදිසි සැලසුමට අනුකූලව සැලසුම සහ වෙනත් අවශ්‍ය කරන උපකරණ පවත්වාගෙන යා යුතු ය.

13. තෙල් උතුරා යාමක් හෝ තෙල් දූෂණයක් පවතින අවස්ථාවක දී අධිකාරිය විසින් අනුමත කරන ලද තෙල් උතුරා යාම පිළිබඳ හදිසි සැලසුම ක්‍රියාත්මක කිරීම, වරාය, නැව්තොටවල්, පර්යන්ත, නැව් අලුත්වැඩියා පොළවල්, නිර්ජල නැව් තටාකාංගන, අක්වෙරළේ ඉදිකිරීම් හෝ නැවකින් නැවකට තෙල් මාරු කිරීම සඳහා භාවිතා කරන නල මාර්ග හෝ වෙනත් යම් උපකරණ සෑම අයිතිකරුවකුගේ, ක්‍රියාකරුවකුගේ, නෞකාධිපතිවරයකුගේ හෝ අනුයෝජිතයකුගේ ම කාර්යය විය යුතු ය.

14. යම් ඉල්ලුම් පත්‍රයක්-

(අ) 10 වන නියෝගය යටතේ භාර දී අනුමත වී නොමැති නම් ; හෝ

(ආ) 11 වන නියෝගය යටතේ අනුමත වී, මේ නියෝගවල විධිවිධානවලට අනුකූල නොවීම නිසා හෝ 12 වන වගන්තියේ නියමයන්ට අනුව පරීක්ෂා කරන කාලය තුළ දී තෙල් උතුරා යාම පිළිබඳ හදිසි සැලැස්ම සමග අනුකූල නොවීම හේතුවෙන් ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබ ඇත්නම්, අධිකාරිය විසින්, ඒ අනනුමතය හෝ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම සඳහා වූ හේතු සහ අනුමතය ලැබීමට යෝග්‍ය වනු පිණිස සැහීමට පත් කළ යුතු හෝ අනුකූල විය යුතු නියමයන් නිශ්චිතව දක්වමින් ලිඛිතව, සැලැස්ම පිළිබඳ බලය ඇති තැනැත්තා වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

15. සැලැස්ම පිළිබඳ බලය ඇත්තේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා විසින්, දැන්වීම ලැබුන දිනයේ සිට දින තිහක් ඇතුළත නිර්දේශිත සංශෝධන අන්තර්ගත කරමින් අලුත් හෝ සංශෝධිත සැලැස්මක් භාර දෙනු ලැබිය යුතු අතර, එම කාල සීමාව තුළ දී දැනට පවතින් සැලැස්ම සංශෝධනවලට යටත්ව හා අවසන් අනුමතය ලැබීමට යටත්ව, ක්‍රියාත්මක වන බවට සලකනු ලැබිය යුතු ය.

එසේ වුව ද, ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමේ හේතුවෙන් අලුත් ඉල්ලුම් පත්‍රයක් භාරදෙන අවස්ථාවක දී, ඉල්ලුම්කරුට, අධිකාරිය මගින් තීරණය කර ඇති පරිදි III වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති ගාස්තුවක් ගෙවීමට නියම කරනු ලැබිය හැකි ය.

16. වරාය, නැව්තොටවල්, පර්යන්ත, නැව් අලුත්වැඩියා පොළවල්, නිර්ජල නැව් තටාකාංගන, අක්වෙරළේ ඉදිකිරීම් හෝ නැවකින් නැවකට තෙල් මාරු කිරීම සඳහා භාවිතා කරන නල මාර්ග හෝ වෙනත් යම් උපකරණ අනුමැතිය සඳහා දෙවනවරටත් ඉදිරිපත් කරන ලද හදිසි සැලැස්මට අනුමතය ලබා ගැනීමට අපොහොසත් වී ඇත්නම්, ශ්‍රී ලංකා ජල තීරය තුළ සහ 1976 අංක 22 දරන සමුද්‍ර කලාප තුළ, ක්‍රියාත්මක කිරීම නොකළ යුතු ය.

17. සැලසුම පිළිබඳ බලය ඇත්තේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා විසින්, හදිසි සැලසුමට අදාළව අධිකාරිය විසින් දෙන ලද තීරණයට එරෙහිව පරිසර විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාට අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය-

(1) සැලසුම දරන්නා විසින් අනනුමතයේ හෝ අනුමතය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම ලැබුන දින සිට දින පහළොවක් ඇතුළත නැවත සලකා බැලීම සඳහා හේතු දක්වමින් සහ ඒ සැලසුමට අදාළව දෙන ලද තීන්දුව නිෂ්ප්‍රභා කිරීමට සාක්ෂි ඇත්නම් ඒවා සපයමින් ලිඛිතව අභියාචනයක් භාර දිය යුතු ය.

(2) මෙම නියෝගයේ (1) වන ඡේදයට අනුකූලව දෙන ලද සාධක සැලකිල්ලට ගැනීමෙන් පසුව ලේකම්වරයා විසින් ඒ තීන්දුව අවලංගු කර සැලැසුම අනුමත කිරීම හෝ තීන්දුව තහවුරු කිරීම කළ හැකි ය.

18. (1) තෙල් උතුරායාම පිළිබඳ හදිසි සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු තැනැත්තා විසින් සෑම තෙල් උතුරා යාමක් පිළිබඳව වූ තොරතුරු වාර්තා කළ යුතු අතර, තෙල් උතුරා යාමේ දින සිට වසර දෙකක කාලයක් සඳහා වාර්තා පවත්වාගෙන යා යුතු අතර, ඒ කාල සීමාව තුළ දී, තත්කාර්යය සඳහා අධිකාරිය විසින් ලිඛිතව බලය දුන් අධිකාරියේ නිලධරයකුගේ ඉල්ලීම පරිදි පරීක්ෂාකර බැලීම සඳහා ඒ වාර්තා ලබා ගැනීමට සැලැස්විය යුතු ය.

(2) වාර්තාවක පහත දැක්වෙන කරුණු අන්තර්ගත විය යුතුය :–

(අ) දූෂක ද්‍රව්‍යය මුදාහරින ලද දිනය, වේලාව, ස්ථානය සහ කාල සීමාව ;

(ආ) මුදාහරින ලද දූෂක ද්‍රව්‍යය පිළිබඳ අනන්‍යතාවය ;

(ඇ) මුදාහරින ලද දූෂක ද්‍රව්‍යය ප්‍රමාණය ;

(ඈ) උතුරා යාමට අදාළ අවස්ථානුගත කරුණු, උතුරා යාමට හේතුව ;

(ඉ) පැතිරීම වැළැක්වීමේ හා පිරිසිදු කිරීමේ ප්‍රයත්නයන් පිළිබඳ තොරතුරු ;

(ඊ) පැතිරීම වැළැක්වීමේ සහ පිරිසිදු කිරීමේ ප්‍රයත්නයන්වල සාර්ථකභාවය පිළිබඳ තක්සේරුවක් ;

(උ) තෙල් උතුරායාමේ ප්‍රතිඵලයක් ලෙස නිරීක්ෂණය කරන ලද යම් අහිතකර ප්‍රතිඵල ;

19. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස-

"ජාතික තෙල් දූෂණ හදිසි සැලැස්ම" යන්නෙන්, 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණ වැළැක්වීමේ පනතේ 6 වැනි වගන්තියේ (උ) ඡේදයට අනුකූලව සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරය විසින් කලින් කල සකස් කර සංශෝධනය කරන ලද, තෙල් දූෂණ සිද්ධීන් සඳහා වූ ජාතික තෙල් දූෂණ හදිසි සැලැස්ම අදහස් වේ.

"තෙල් මෙහෙයුම් පහසුකම" යන්නෙන්, තෙල් දූෂණ සිද්ධියක් පිළිබඳ අවදානම පෙන්නුම් කරන සහ අක්වෙරළ ඉදිකිරීමකට ඇතුළත් නොවන එහෙත් තෙල් ගෙන යාම සඳහා භාවිතා කරන වෙනත් දේ අතර තෙල් පර්යන්ත, නල මාර්ග සහ වෙනත් යම් තෙල් මෙහෙයුම් පහසුකමක් අදහස් වේ.

"තෙල් උතුරායාම පිළිබඳ හදිසි සැලැස්ම" යන්නෙන්, තෙල්වලින් සමුද්‍ර දූෂණය සිදුවන හෝ සිදුවිය හැකි සිද්ධීන් වලට ප්‍රතිචාර දැක්වීම සඳහා ද, ඒ දූෂණය වැළැක්වීමේ හෝ ඒ දූෂණයේ බලපෑම අඩු කිරීමේ හෝ අවම කිරීමේ අරමුණින් සකස් කරනු ලබන (තෙල් උතුරායාම පිළිබඳ ජාතික වශයෙන් හදිසි සැලසුමක් නොවන) හදිසි සැලැස්ම අදහස් වේ.

"තෙල් දූෂණ සිද්ධීන් " යන්නෙන්, තෙල් මුදා හැරීමකින් ප්‍රතිඵලයක් වන හෝ ප්‍රතිඵලයක් විය හැකි සමුද්‍ර පරිසරයට හෝ ශ්‍රී ලංකාවේ සමුද්‍ර තීරයට හෝ ආශ්‍රිත දේපළකට බලපෑමක් ඉදිරිපත් වන හෝ තර්ජනයක් ඉදිරිපත් විය හැකි සහ හදිසි ක්‍රියා මාර්ගයක් හෝ වෙනත් කඩිනම් ප්‍රතිචාරයක් අවශ්‍ය වන එකම ප්‍රභවයකින් ඇතිවන සිදුවීමක් හෝ සිදුවීම් මාලාවක් අදහස් වේ.

(9 වැනි නියෝගය)

**1 වැනි උපලේඛනය**

***2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත***

*තෙල් උතුරා යාම පිළිබඳ හදිසි සැලැස්ම සඳහා වන මාර්ගෝපදේශන*

1. (මෙහි මින් මතු "ඕ. එස්. සී. පී. (OSCP)" යනුවෙන් හඳුන්වනු ලබන) තෙල් උතුරා යාම පිළිබඳ එක් එක් හදිසි සැලසුමේ පහත දැක්වෙන ප්‍රධාන කොටස් තුන ඇතුළත් විය යුතු ය -

(අ) ක්‍රමෝපායන අංශය

(ආ) ක්‍රියාමාර්ග අංශය

(ඇ) තොරතුරු අංශය

2. සෑම ඕ. එස්. සී. පී. (OSCP) සැලැස්මක ම අත්‍යවශ්‍ය සවිස්තර තොරතුරු විය යුතු ය –

(අ) වගකිව යුතු අධිකාරිය සහ මෙහෙයුම් සැලසුම්වල සීමාවන් පිළිබඳ තොරතුරු

(ආ) තෙල් උතුරා යාමේ අවදානම පිළිබඳ හඳුනාගැනීම් (අවදානමේ තක්සේරුව පිළිබඳ ප්‍රමාණවත් සාක්ෂි)

(ඇ) දේශීය පාරිසරික සංවේදීතාව පිළිබඳ තොරතුරු (සංවේදිතා ප්‍රදේශ හඳුනාගැනීම සහ ප්‍රමුඛතාකරණය)

(ඈ) පූර්ව එකඟතා ප්‍රතිචාර ක්‍රමෝපායන

(ඉ) සංවිධානවල ප්‍රතිචාර පිළිබඳ දළ සැළැස්ම

(ඊ) අභ්‍යාස, පුහුණු වැඩ සටහන් සහ සැලැස්ම සඳහා වන ක්‍රියා පටිපාටිය සමාලෝචනය

(උ) දැනුම් දීමේ ක්‍රියා පටිපාටිය

(ඌ) අභ්‍යන්තර සහ බාහිර යන අංශ දෙකේම සන්නිවේදන සැලසුම්

(එ) පුද්ගලයන් සහ උපකරණ රැස් කිරීම සඳහා ක්‍රියා පටිපාටිය

(ඒ) පිරිවැය පාලනය සහ ක්‍රියාමාර්ග ඇතුළුව මූල්‍ය කළමනාකරණය

(ඔ) ප්‍රතිචාර ශක්‍යතාවය පිළිබඳ ලැයිස්තුගත කිරීම (පුද්ගලයන් සහ උපකරණ)

(ඕ) බැහැර කිරීමේ සැලසුම් (තෙල් සහිත අවශේෂ ද්‍රව්‍යයන් ඉවත් කිරීම පිණිස පිළියම් යෙදීම සඳහා සැලසුම් සකස් කිරීම)

(ක) පිරිසිදු කිරීම සඳහා වූ ප්‍රතිචාර අවසන් කිරීම සඳහා ක්‍රියාපටිපාටිය

(ග) යථාවත් කිරීම සඳහා සහ ප්‍රතිශෝධනය කිරීම සඳහා වර්ගීකරණයක්

3. ඕ. එස්. සී. පී. (OSCP) සැලැස්ම පහත දැක්වෙන නියමයන්ට අනුකූල විය යුතු ය :-

(අ) එක් එක් සැලසුම්වලින් තෙල් බැහැර කිරීම සඳහා ප්‍රතිචාර දැක්වීමට සම්බන්ධව පවරන ලද සියලු බලතල සහ වගකීම් හඳුනාගැනීම-

| | | | |
|---|---|---|---|
| (i) | නිවේදනය ක්‍රියාත්මක කිරීම | - | සෑම මාස හයකට වරක් |
| (ii) | ප්‍රමුඛ ක්‍රියාකාරකම් | - | සෑම අවුරුද්දකටම වරක් |
| (iii) | උපකරණ විහිදුම් අභ්‍යාස | - | සෑම අවුරුදු දෙකකට වරක් |

(ආ) සැලැස්ම අවම වශයෙන් සෑම අවුරුදු දෙකකට වරක් හෝ අවස්ථානුගත කරුණු අනුව හෝ අධිකාරිය විසින් ඉල්ලා සිටී නම් ඊට කලින් විධිමත් ලෙස යථාවත් කිරීම සහ ප්‍රතිශෝධනය කිරීම කළ යුතු ය. සෑම තෙල් උතුරා යාමේ අවස්ථාවකට හෝ ක්‍රියාකාරකමකට අනුව සැලැස්ම ප්‍රතිශෝධනය කරනු ලැබිය යුතු ය.

(ඇ) ඕ. එස්. සී. පී. (OSCP) සැලැස්ම, එය භාවිතා කිරීමට බලාපොරොත්තු වන තැනැත්තන්ට භාවිතා කිරීමට සහ තේරුම් ගැනීමට පැහැදිලි සංක්ෂිප්ත, සාමාන්‍ය සහ පහසු සැලැස්මක් විය යුතු ය.

(ඈ) සෑම ඕ. එස්. සී. පී. (OSCP) සැලැස්මක් ම (මෙහි මින් මතු එම්. ඊ. පී. ඒ (MEPA) යනුවෙන් සඳහන් කරනු ලබන) සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය වෙත භාරදෙනු ලැබිය යුතු අතර එම්. ඊ. පී. ඒ. (MEPA) මගින් අනුමතය ලබාදිය යුතු ය. පසුව යම් සංශෝධනයක් අවශ්‍ය වේ නම්, පසුව සිදු කරන ලද ඒ සංශෝධනය පිළිබඳව ඒ සංශෝධනය සිදු කිරීමෙන් සතියක් ඇතුළත එම්. ඊ. පී. ඒ. (MEPA) වෙත එම සංශෝධන සම්පූර්ණ වශයෙන් දැනුම් දෙනු ලැබිය යුතු ය.

(ඉ) ඕ. එස්. සී. පී. (OSCP) සැලැස්ම අනුමත කිරීම එම්. ඊ. පී. ඒ. (MEPA) විසින් ප්‍රතික්ෂේප කරන අවස්ථාවක දී, එම්. ඊ පී. ඒ. (MEPA) මගින් අනුමතය දීම ප්‍රතික්ෂේප කිරීමේ දින සිට දින තිහක් ඇතුළත, අදාළ ආයතනය විසින් ඕ. එස්. සී. පී. (OSCP) සැලැස්ම සංශෝධනය කිරීමට නොපමාව පියවර ගනු ලැබිය යුතු අතර, එය අනුමතය සඳහා එම්. ඊ. පී. ඒ. (MEPA) වෙත නැවත භාරදිය යුතු ය.

(ඊ) ඕ. එස්. සී. පී. (OSCP) සැලැස්මට කරනු ලැබූ සංශෝධන භාරදීම සම්බන්ධයෙන් අදාළ නියෝජ්‍යායතන සමග එම ලේඛනය එම්. ඊ. පී. ඒ. (MEPA) වෙත ලැබීමෙන් වැඩ කරන දින දහයක් ඇතුළත එම්. ඊ. පී. ඕ (MEPA) මගින් සන්නිවේදනය කළ යුතු ය.

(10 වැනි නියෝගය)

*II වැනි උපලේඛනය*

***2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත***

*තෙල් උතුරායාම පිළිබඳ හදිසි සැලැස්ම අනුමත කිරීම සඳහා සහ ඒ සඳහා වන ගෙවීම් සඳහා වූ ඉල්ලුම් පත්‍රයේ ආකෘතිය*

1. ඉල්ලුම්කරුගේ තොරතුරු

1.1 නියෝජ්‍යායතනයේ නම

| |
|---|
| |

1.2 ලිපිනය

| |
|---|
| |

1.3 තොරතුරු විමසීම

| | | |
|---|---|---|
| දුරකථනය : | ෆැක්ස් : | ඊමේල් : |

1.4 විමසිය හැකි තැනැත්තන්

| | | |
|---|---|---|
| නම : | තනතුර : | |
| දුරකථනය : | ෆැක්ස් : | ඊමේල් : |

2. තෙල් උතුරායාම පිළිබඳ හදිසි සැලසුම සඳහා අනුමතය ලබා ගැනීමට අවශ්‍ය කරන පහසුකම්/භූමිය

2.1 පහසුකම්වල හෝ භූමියේ නම

| |
|---|
| |

2.2 ලිපිනය

| |
|---|
| |

3. ගෙවීම්

3.1 කාර්යය

| | |
|---|---|
| 1. ඉල්ලුම්පත්‍ර ගාස්තු | |
| 2. අනුමත කිරීමේ ගාස්තු | |
| 3. ගෙවීම් අලුත් කිරීමේ ගාස්තු – | |
| (අ) සංශෝධන රහිතව | |
| (ආ) සංශෝධන සහිතව | |
| ගෙවීම් ක්‍රම : චෙක්පත් / බැංකු අණකර | |
| | |
| | |

සභාපති/එම්. ඊ. පී. ඒ. (MEPA)

මේ සමග පහත දැක්වෙන–

(1) තෙල් උතුරා යාම පිළිබඳ හදිසි සැලසුමේ පිටපත් දෙකක්

(2) ඉහත 3 වැනි නියමයේ පරිදි චෙක්පත් / බැංකු අණකර මගින් ගෙවීම්

(3) සමාගමට අයත් නාශක උපකරණ ලැයිස්තුව

(4) (අ) ………………………………………

(ආ) ………………………………………

(ඇ) …………………………………… අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම (එම්. ඕ. යූ.) (MOU)

ලේඛන භාරදෙන (සමාගමේ නම) ………………………………………………………………………වෙනුවෙන් පහත අත්සන් කරන ……………………………………සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරියේ එම්. ඊ. පී. ඒ. (MEPA) තෙල් උතුරා යාම පිළිබඳ හදිසි සැලසුමේ නියමයන් සහ කොන්දේසිවල අන්තර්ගතයන් සුපරීක්ෂාකාරී ලෙස අධ්‍යයනය කරමින්, ඒ නියම සහ කොන්දේසිවල අවශ්‍යතාවයන්ට බැඳී සිටීමට එකඟ වන බවට මෙයින් සහතික වෙමි. තව ද මා විසින් ඉහත දක්වා ඇති තොරතුරු සම්පූර්ණ, සත්‍ය සහ නිවැරදි දත්ත බවට සහතික කරමි.

| | | |
|---|---|---|
| ……………………… | ……………………… | ……………………… |
| දිනය | ඉල්ලුම්කරුගේ අත්සන. | ඉල්ලුම්කරුගේ අත්සන. |
| | ……………………… | ……………………… |
| | ඉල්ලුම්කරුගේ නම | ඉල්ලුම්කරුගේ නම |

සමාගමේ මුද්‍රාව

*(කාර්යාලීය භාවිතය සඳහා පමණි)*

1. ගෙවන ලද මුදල ඃ
2. සාමාන්‍ය රිසිට්පත් අංකය ඃ
3. බලපත්‍ර අංකය ඃ
4. බලපත්‍රය නිකුත් කළ/අලුත්කළ දිනය ඃ
5. පරීක්ෂා කිරීම්/අදහස් ඃ

*(II වැනි නියෝග)*

III වැනි උපලේඛනය

***2008 අංක 35 දරන සමුද්‍ර දූෂණ වැළැක්වීමේ පනත***

*ඉල්ලුම්කරු විසින් ගෙවිය යුතු ගාස්තු*

---

ගාස්තු -

| | |
|---|---|
| ඉල්ලුම්පත්‍ර ගාස්තුව | රු. 1,000.00 |
| ඕ. එස්. සී. පී. (OSCP) අනුමත කිරීමේ ගාස්තුව | රු. 50,000.00 |
| ඕ. එස්. සී. පී. (OSCP) (සංශෝධන රහිතව) අලුත් කිරීමේ ගාස්තුව | රු. 40,000.00 |
| ඕ. එස්. සී. පී. (OSCP) (සංශෝධන සහිතව) අලුත් කිරීමේ ගාස්තුව | රු. 50,000.00 |

IV වැනි උපලේඛනය

***2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත***

*තෙල් උතුරායාම පිළිබඳ හදිසි සැලැස්ම අනුමත කිරීම*

2012 අංක ...............දරන තෙල් උතුරා යාම පිළිබඳ හදිසි සැලැස්මේ නියෝගවලට අනුව පහත දක්වා ඇති නියමයන් සහ කොන්දේසිවලට යටත්ව ..........................සඳහා ....................................................විසින් භාරදෙන ලද තෙල් උතුරා යාම පිළිබඳ හදිසි සැලසුම මම මෙයින් අනුමත කරමි.

අවසන් වන දිනයට පෙරාතුව මේ අධිකාරිය විසින් අන්‍යාකාරයකින් අවලංගු කර හෝ අත්හිටුවා ඇත්නම් මිස මෙම අනුමතය ....................................................දින සිට .........................................දින දක්වා බලාත්මක විය යුතු ය.

සභාපති/බලයලත් නිලධරයා
සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරිය.

දිනය :

**නියම සහ කොන්දේසි**

1. තෙල් උතුරායාම පිළිබඳ හදිසි සැලසුම් අනුමැතිය පැවරිය නොහැකි ය.

2. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් -

   (අ) තෙල් උතුරා යාම පිළිබඳ හදිසි සැලසුමට සම්බන්ධ කර්තව්‍යයන් සහ කාර්යයන් ප්‍රමාණවත් පරිදි සිදු නොකරන බවට, ; හෝ

   (ආ) 2012 අංක ......................දරන තෙල් උතුරා යාම පිළිබඳ හදිසි සැලසුම නියෝගයේ විධිවිධාන අනුකූල නොවන බවට,

සෑහීමට පත් වී ඇත්නම්, ඒ අනුමැතිය අත්හිටුවීම හෝ අවලංගු කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

08-833

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

2 - G 16439